මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ - 02/2016

මගේ අංක : CPC/PSC/09/කා.නි./ 02
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක: 244,
කටුගස්තොට පාර,
මහනුවර,
2016 ඔක්තෝම්බර් මස 14 දින

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් වෙත.

**කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම.**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතු අතර එසේ සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවලට අනුකූලව, බඳවාගනු ලබන නිලධාරීන් වසර 03ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉමද, II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස්වීම් දින සිට වසර 03ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉමද, I ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් උසස්වීම් දින සිට වසර 05ක් ඇතුළත තුන්වන කාර්යක්ෂමතා කඩඉමද සම්පූර්ණ කළ යුතුය.

02. එසේ වුවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇති වන ගැටළු සම්බන්ධයෙන් 2016.05.24 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 හි විධිවිධානවලට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා ඇතිවන පරිපාලනමය ගැටළු සම්බන්ධයෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් මෙම පළාත් සභාවේ නිලධාරීන් සඳහා පහත සඳහන් සහන ලබාදීමට අනුමැතිය ලබා දී ඇත.

03. ඒ අනුව, නියමිත සේවා ව්‍යවස්ථාවේ හෝ බඳවා ගැනීමේ පරිපාටියෙහි වසරකට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්විය යුතු වාර ගණන නිශ්චිත වශයෙන් සඳහන් කර ඇති නමුත්, නියමිත පරිදි විභාගය නොපැවැත්වීම මත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළයුතු කාල සීමාව තුළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග සංඛ්‍යාවක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ හැකිය.

04. මෙම චක්‍රලේඛය මගින්, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වූ නිලධාරීන්ට ජ්‍යෙෂ්ඨත්වයට හානි නොවන පරිදි, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළයුතු කාල සීමාව තුළ සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග සංඛ්‍යාවක් මගින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය අනුමැතිය ලබාදී ඇති බැවින් නියමිත කාලය තුළදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මේ සමඟ අමුණා ඇති උපලේඛන අංක:01 හි සඳහන් ආකෘති පත්‍රයට අනුව සකස් කර පත්වීම් බලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කළ යුතුය.

| අංක | නිලධාරි ගණය | අනුමැතිය ලබාදිය යුතු නිලධරයන් |
| --- | --- | --- |
| 1 | දිප ව්‍යාප්ත සේවයට අදාළ නිලධරයින් | අදාළ පරිපාලන බලධාරියා |
| 2 | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පත්වීම් බලධාරියා වන තනතුරුවලට අයත් නිලධරයන් | මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 3 | ඉහත අංක 01, හා 02 කාණ්ඩයන්ට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපනය කර ඇති තෘතිය, ද්විතියන හා ප්‍රාථමික මට්ටමේ නිලධරයින් (අමාත්‍යාංශ ලේකම් පත්වීම් බලධාරියා වන) | මධ්‍යම පළාතේ අදාළ අමාත්‍යාංශ ලේකම් |
| 4 | ඉහත අංක 01, 02 හා 03 කාණ්ඩයන්ට අයත් නොවන දෙපාර්තමේන්තුගත තනතුරු යටතට ගැනෙන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපනය කර ඇති තෘතිය, ද්විතියන හා ප්‍රාථමික මට්ටමේ නිලධරයින් | මධ්‍යම පළාතේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා |

05. කෙසේ වුවද උක්ත ඡේදයේ විධිවිධාන අදාළ වනුයේ ලිඛිත, වාචික හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පමණි. හැකියා ප්‍රවර්ධන වැනි පාඨමාලා කාර්යක්ෂමතා කඩඉම ලෙස සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන්ව ඇති නිලධාරීන්ගේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම සඳහා නිර්දේශ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 1:14 හි විධිවිධාන පරිදි පහත සඳහන් කරුණු සඳහා පමණක් අනුමැතිය ලබාගැනීම සඳහා මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

i. තමන්ට පාලනය කරගත නොහැකි හේතූන් මත නියමිත දිනට අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ නොහැකි වීම.

ii. නියමිත සුදුසුකම්වලට සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.

06. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2016 මෙයින් අවලංගු කෙරේ.

ආර්.එම්.එන්.රත්නායක.
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

# රජයේ නිලධාරියෙකු කාර්යක්ෂමතා කඩඉම් සඳහා සහන ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම.

1. අයැදුම්කරු පිළිබඳ තොරතුරු :
   - 1.1 සම්පූර්ණ නම: ........................................................
   - 1.2 උපන් දිනය: ........................................................
   - 1.3 ජාතික හැඳුනුම්පත් අංකය: ................................................
   - 1.4 කිසියම් සේවයකට අයත්නම්,
     - 1.4.1. එම සේවය:. ..............................................
     - 1.4.2. පන්තිය:. ..................... ශ්‍රේණිය. .....................
   - 1.5 දැනට දරන තනතුර: ..................................................
   - 1.6 සේවා ගණය (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව): ...............
     - 1.6.1.ශ්‍රේණිය: ..............................................
   - 1.7 වර්තමාන සේවා ස්ථානය: ..................................................

2. කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ තොරතුරු:
   - 2.1 නියමිත දිනය: ......................................
   - 2.2 එයට අදාළ වන ශ්‍රේණිය/ තනතුරට පත්වූ දිනය: ...........................
   - 2.3 කාර්යක්ෂමතා කඩඉමට එළඹෙන දිනය:. ..............................
   - 2.4 කාර්යක්ෂමතා කඩඉම් විභාගය දැනටමත් සමත්වී ඇත්නම්, සමත්වූ දිනය:. ........
   - 2.5 සහනය අපේක්ෂිත කාලසීමාව : ...........................

..................... .....................

දිනය ඉල්ලුම්කරුගේ අත්සන

3. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ

...........................................................................
...........................................................................
...............................................................

..................... .....................

දිනය අත්සන

නම:. ..........................

තනතුර: ..........................

4. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

...........................................................................
...........................................................................
...............................................................

..................... .....................

දිනය අත්සන

නම:. ..........................

තනතුර: ..........................

5. පරිපාලන බලධාරියාගේ/ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ නිර්දේශ:

...........................................................................
...........................................................................
...............................................................

..................... .....................

දිනය අත්සන

නම:. ..........................

තනතුර: ..........................